ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

**ඉන්දීය ප්‍රදාන යටතේ පොළොන්නරුවේ ඉදි කළ බහු වාර්ගික ත්‍රෛභාෂා පාසල විවෘත කෙරේ**

ඉන්දියානු ප්‍රදාන යටතේ පොළොන්නරුවේ ඉදි කළ බහු වාර්ගික ත්‍රෛභාෂා පාසල 2025 ඔක්තෝබර් 31 වන දින ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය මැතිනිය සහ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමා විසින් විවෘත කර ශ්‍රී ලංකා රජය වෙත භාර දෙන ලදී. නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ටී. බී. සරත්, පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් රත්නසිරි, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නාලක කලුවැව, උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් ජයලත් යන මහත්වරුන් ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

2. බහු වාර්ගික සහ බහු සංස්කෘතික පරිසරයක් තුළ ගුණාත්මක අධ්‍යාපන අවස්ථා සලසාදීම සඳහා ඉහළ බලපෑමක් සහිත ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස පාසල ස්ථාපිත කිරීම සඳහා වන අවබෝධතා ගිවිසුමට දෙරටෙහි රජයන් විසින් 2017 පෙබරවාරි මාසයේදී අත්සන් තබන ලදී. ව්‍යාපෘතිය සඳහා ඉන්දියාව ලබා දෙන මූල්‍යාධාරය ශ්‍රී ලංකා රුපියල් මිලියන 320කට අධිකය. සමස්ත පරිශ්‍රය සඳහා පවතින සැලසුම්වලට අනුව ශ්‍රී ලංකා රජය විසින් ඔක්තෝබර් 31 වන දින විවෘත කරන ලද ගොඩනැගිල්ලට තවත් අමතර ඉදිකිරීම් ද සිදු කරනු ලැබේ.

3. උත්සව සභාව අමතමින්, අග්‍රාමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය මැතිනිය ශ්‍රී ලංකාව තුළ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහයෝගය ලබා දීම සම්බන්ධයෙන් ඉන්දීය රජයට සහ ජනතාවට කෘතවේදීත්වය පළ කළාය. මෙම ව්‍යාපෘතිය විවෘත කර භාර දීමත් සමඟ ඉන්දියාව සිය වැඩ කොටස ඉටු කර තිබෙන බවත් එය ඉදිරියට රැගෙන යාම දැන් ශ්‍රී ලංකා රජයේ වගකීමක් බවත් එතුමිය ප්‍රකාශ කළාය.

4. යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම සහ ගුරු හිඟය වැනි ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය මුහුණ දෙන ගැටලු විසඳීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ගන්නා ප්‍රයත්නයන් පිළිබඳව සඳහන් කළ අග්‍රාමාත්‍යතුමිය විවිධ සංවර්ධන සහයෝගිතා මුලපිරීම් හරහා ඉන්දියාව විසින් ලබා දෙන සහය අගය කළාය.

5. මෙම අවස්ථාව අමතමින් මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමා දෙරටෙහි ජනතාවගේ සුබ සිද්ධිය උදෙසා ඉන්දිය සහ ශ්‍රී ලංකා රජයන්ගේ පොදු කැපවීම අවධාරණය කළේය. දෙරට අතර පවතින මනා සුසංයෝගීතාවය සහ දෙරට විසින් අනුගමනය කරන ප්‍රවේශයන් මෙම කැපවීමට තවත් ශක්තියක් වන බව එතුමා සඳහන් කළේය. විශේෂයෙන්ම 2020 වසරේදී ඉන්දියාව විසින් හඳුන්වා දුන් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ ව්‍යුහාත්මක වෙනස්කම් රටෙහි අධ්‍යාපන ක්ෂේත්‍රය පරිවර්තනීය වෙනසකට ලක් කරමින් සිටින බව එතුමා පෙන්වා දුන්නේය. එසේම, අග්‍රාමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය මැතිනියගේ නායකත්වය යටතේ ශ්‍රී ලංකාව 2026 වසරේදී නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට සූදානම් වන බව එතුමා පැවසීය. මෙම පරිවර්තනීය ගමනේ විවිධ පැතිකඩ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ඉන්දියාව සූදානමින් පසු වන බව මහ කොමසාරිස්තුමා ප්‍රකාශ කළේය. ඉන්දියාව ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සුබවාදී බලපෑමක් ඇති කළ හැකි සංවර්ධන සහයෝගිතා ව්‍යාපෘතීන් සඳහා තවදුරටත් සහයෝගය ලබා දෙන බව ද එතුමා අවධාරණය කළේය.

6. දිවයින පුරා පාසල් සහ අධ්‍යාපන ආයතන සිය ගණනක යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සහ ඩිජිටල් උපකරණ ලබා දීම, පුත්තලම, මඩකලපුව සහ නුවර එළිය යන ප්‍රදේශවල වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම සහ සහය ලබා දීම, රුහුණු විශ්ව විද්‍යාලයේ ඉදි කරන ලද ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයක් සතු විශාලතම ශ්‍රවණාගාරය වන රබින්ද්‍රනාත් තාගෝර් අනුස්මරණ ශ්‍රවණාගාරය, පසුගිය වසරේදී වතුකර පාසල් ගුරුවරුන් 2000කට අධික සංඛ්‍යාවකට STEM විෂයන් සම්බන්ධයෙන් පුහුණුව ලබා දීම, දකුණු පළාතේ පාසල්වල සුහුරු පන්ති කාමර සහ පරිගණක විද්‍යාගාර 200ක් ස්ථාපනය කිරීම යනාදිය ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඉන්දියාව විසින් ක්‍රියාවට නංවන ලද සංවර්ධන සහයෝගිතා ව්‍යාපෘතීන් කිහිපයකි. එසේම, ඉන්දියාවේ උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා ශ්‍රී ලාංකේය සිසු සිසුවියන් 200කට ශිෂ්‍යත්ව පිරිනමනු ලැබේ. ශ්‍රී ලංකාව තුළ අධ්‍යයන පාඨමාලා හැදෑරීම සඳහා විශ්ව විද්‍යාල සිසු සිසුවියන් 500කට අධික පිරිසකට ඉන්දියාව විසින් මූල්‍යාධාර ලබා දෙයි.

****

**කොළඹ**

***2025 ඔක්තෝබර් 31***